# නිම්නය

**ඒ කාලයේදී 2500 ක පමණ පිරිසක් ඉල්ලුම් කළත් බඳවා ගත්තේ 12 ක පමණ පිරිසක් පමණයි. මම හමුදාවට බැඳුණු අවස්ථාවේදී ආනන්දයෙන් 150 ක පමණ පිරිසක් ඉල්ලුම් කොට තිබුණා. එබඳු පසුබිමක් තුළ පවා මට හමුදාවට සම්බන්ධවීමට අවස්ථාව උදාවූයේ ආනන්දයෙන් ලැබුණ පසුබිම සහ උපකාරය නිසා බව මම පිළිගන්නවා.**



දෙවන ලුතිනන්වරයකු ලෙස (වමේ සිට දෙවැන්නා)

# යුද හමුදපති වීමට ආනන්දයේ ජීවිතය මට බලපෑවා


## යුද හමුදපති ලුතිනන් ජනරාල් සරත් ෆොන්සේකා

පසුගිය දිනක වත්මන් ආරක්ෂක තත්ත්වය පිළිබඳ විමසීම සඳහා යුද හමුදපති ලුතිනන් ජනරාල් සරත් ෆොන්සේකා මහතා හමුවූ අවස්ථාවේදී ඔහුගේ සාර්ථකත්වයට බලපෑ හේතු සාධකයන් පිළිබඳව විමසීමට අප අමතක නොකළෙමු. සෑම පුද්ගලයකුගේම සාර්ථකත්වය සඳහා ඔහු ලද අධ්‍යාපනය හේතු වන බැවින්ද දශක තුනක පමණ කාලයක් පුරා මෙරට බෙදා වෙන්කිරීමට කොටි ත්‍රස්තවාදීන් දරන උත්සාහය පරාජය කිරීම සඳහා කොළඹ ආනන්ද මහා විද්‍යාලයෙන් ත්‍රිවිධ හමුදාවට එක් වී ඇති ආදි ආනන්දීයන් තීරණාත්මක කාර්යභාරයන් ඉටුකොට ඇති බැවින්ද යුද හමුදපතිවරයා කොළඹ ආනන්දයෙන් අකුරු කළ සමය පිළිබඳව අප පළමුවෙන්ම විමසා සිටියා.

"මම කොළඹ ආනන්දයට ඇතුළත් වීමට පෙර රටේ වෙනත් ප්‍රදේශවල පාසල්වලටත් ගිහින් තිබෙනවා. මගේ දෙමව්පියන් ගුරුවරු වූ නිසා ඔවුන්ට රටේ විවිධ ප්‍රදේශවල සේවය කිරීමට සිදුවූවා. කොළඹ ආනන්ද විද්‍යාලයට ඇතුළත් වූයේ උසස් පෙළ හැදෑරීම සඳහායි.

මට ආනන්ද විද්‍යාලයට ඇතුලත් වීම සඳහා එල්. එච්. මෙත්තානන්ද, පී. ද එස්. කුලරත්න යන මහත්වරුන් උදව් කොට තිබෙනවා. මගේ පියා ගුරුවරයකු වූ නිසාත් මෙත්තානන්ද මහතා සහ කුලරත්න මහතා මගේ ගමේ පුද්ගලයන් වූ නිසාත් මගේ පියා ආශ්‍රය කොට තිබෙනවා.

මම අවුරුදු 4 ක් ආනන්දයෙන් අධ්‍යාපනය ලබා තිබෙනවා. අවුරුදු 4 ක් පමණක් අධ්‍යාපනය ලැබුවත් ශිෂ්‍ය නායකයකු වීමේ දුර්ලභ අවස්ථාව උදාවුණා. ශිෂ්‍ය නායකයකු වගේම ශිෂ්‍ය භට කණ්ඩායමේ නායකයා ලෙසත් කටයුතු කොට තිබෙනවා.



හමුදව තුළ පැවති තරගයකින් ජයගෙන (වමේ සිට පළමුවැන්නා)

1967 දී ආනන්දයේ ශිෂ්‍යභට කණ්ඩායම හර්මන්ලොස් සම්මානය දිනා ගත්තා. ඒ වෙනකොට මම පළමු වන වසර ශිෂ්‍ය භටයකු ලෙස කටයුතු කළා. හිටපු ජනාධිපති ප්‍රේමදාස මහතාට එල්ල කළ බෝම්බ ප්‍රහාරයෙන් මියගිය එස්. එස්. පී. සරත් මහින්ද මහතාත් අපත් සමග පළමු වසර ශිෂ්‍ය භටයකු ලෙස කටයුතු කළා. 1968 වසරේදී කොළඹ බටහිර 3 වන බලඇණියේ ප්‍රථම ස්ථානය අප දිනාගත්තා. නමුත් හර්මන්ලොස් දිනාගැනීමට නොහැකි වූවා. මම ශිෂ්‍ය භට කණ්ඩායමේ සැරයන් ලෙස 1969 දී කටයුතු කළා. ඒ අවස්ථාවෙදීත් කොළඹ 3 වන බලඇණියේ ප්‍රථම ස්ථානය දිනාගත්තා. නමුත් හර්මන් ලොස්වලින් අප දෙවන ස්ථානයට පත්වූවා.

ලංකාවේ පුහුණු කළ පළමු වන හමුදා කණ්ඩායමට 11 දෙනකු ඇතුලත් වී තිබෙනවා. එම 11 ස් දෙනාගෙන් 3 දෙනකු තෝරාගෙන තිබෙන්නේ ආනන්දයෙන්. ලංකාවේ පුහුණු කළ දෙවන හමුදා කණ්ඩායමට ආනන්දයෙන් කිසිවකු තෝරාගෙන නැහැ. නමුත් ලංකාවේ පුහුණු කළ 3 වන කණ්ඩායමට ආනන්දයෙන් දෙදෙනකු තේරී පත් වූවා. එකොලොස්දෙනකු වූ එම කණ්ඩායමට ආනන්දයෙන් මමත්, මගේ පංතියේ සහ මම සාජන් ලෙස කටයුතු කළ කණ්ඩායමේ සිටි රණතුංග යන ශිෂ්‍යයාත් ඇතුළත් වූවා. ඒ වන විට ඔහුගේ පියා හමුදවේ කර්නල්වරයකු ලෙස කටයුතු කරමින් සිටියා. ඒ කාලයේදී 2500 ක පමණ පිරිසක් ඉල්ලුම් කළත් බඳවා ගත්තේ 12 ක පමණ පිරිසක් පමණයි. මම හමුදවට බැඳුණු අවස්ථාවෙදී ආනන්දයෙන් 150 ක පමණ පිරිසක් ඉල්ලුම් කොට තිබුණා. එබඳු පසුබිමක් තුළ පවා මට හමුදවට සම්බන්ධවීමට අවස්ථාව උදවූයේ ආනන්දයෙන් ලැබුණ පසුබිම සහ උපකාරය නිසා බව මම පිළිගන්නවා.


1970 ආණ්ඩු මාරුවෙන් පසුව හමුදවට විශාල කණ්ඩායම් දෙකක් බඳවා ගත්තා. එම කණ්ඩායම් දෙකට ආනන්දයෙන් 15 ක පමණ පිරිසක් ඇතුළත් වූවා. හමුදවට බැඳීම සඳහා එද ආනන්දයේ ශිෂ්‍යයන්ගෙන් විශාල ඉල්ලුමක් තිබුණා. අපත් සමඟ හමුදවට බැඳීම සඳහා ඉල්ලුම් කොට දෙවන, තුන්වන පරීක්ෂණ වලින් අසමත් වූ සමහර අය පසුකාලීනව අධිකරණ විනිශ්චයකරුවන් ලෙස පවා පත්වූවා. තිස්ස ඒකනායක යන මීටර් 100 සහ මීටර් 200 යන තරගවලින් ශූරතා දිනපු ආනන්දයේ ශිෂ්‍යයකු දෙවන පරීක්ෂණයෙන් අසමත් වූවා. නමුත් ඔහු පසුව දිස්ත්‍රික් උසාවියේ විනිසුරුවකු ලෙස කටයුතු කොටයි විශ්‍රාම ගියේ. එතරම් දක්ෂ අයටත් එදා හමුදවට බැඳීම අපහසු කටයුත්තක් වූවා. නමුත් ශිෂ්‍ය භට කණ්ඩායමෙන් ලද ආභාෂය නිසා මට හමුදවට සම්බන්ධවීමේ අවස්ථාව උදාවූවා.

ඒ දවස්වල ශිෂ්‍ය භටයන් දෙදෙනකු ඉන්දියාවට යැවීමේ සම්ප්‍රදායක් තිබුණා. මම හිතන්නේ දැනුත් ශිෂ්‍ය භටයන් දෙදෙනකු ඉන්දියාවට යවනවා. මම හමුදවට බැඳීම සඳහා ඉල්ලුම් කළ වර්ෂයේදී මමත්, ට්‍රිනිටි විද්‍යාලයේ ශිෂ්‍ය භට කණ්ඩායමේ සාජනුත්, ඉන්දියාවට යෑම සඳහා තේරුණා. ට්‍රිනිටි විද්‍යාලයේ සාජන් පළමුවෙනියාට ලකුණු ලබා ගත්තා. ඒ දවස්වල ට්‍රිනිටි, සෙන්තෝමස් යන පාසල්වල ශිෂ්‍යයන්ට හොඳින් ඉංග්‍රීසි භාෂාව හැසිරවීමේ හැකියාව තිබුණා. සම්මුඛ පරීක්ෂණයෙන් ට්‍රිනිටි විද්‍යාලයේ සාජන් පළමුවෙනියා ලෙසත් මම දෙවැනියා ලෙසත් තෝරා ගත්තා. ඉන්දියාවේ ගමන සඳහා සියලු කටයුතු සූදනම් කොට තිබියදී එවකට සිටි අධ්‍යාපන ඇමැතිවරයා නියෝගයක් දී තිබෙනවා. එම වර්ෂයේ හර්මන්ලොස් දිනූ කුලියාපිටිය මධ්‍ය මහාවිද්‍යාලයේ සාජන් ඉන්දියාවේ ගමනට එක් කරන ලෙසට එවකට අධ්‍යාපන ඇමැතිවරයා ලෙස කටයුතු කළේ ඊරියගොල්ල මහතායි. ඊරියගොල්ල මහතාගේ නියෝගය නිසා මගේ ඉන්දියානු ගමන නතර වූවා.

ඒ අවස්ථාව වන විටත් හමුදවට බැඳීමේ අවසාන පරීක්ෂණය සඳහා මාව කැඳවා තිබුණා. මම හමුදවට බැඳීමේ අවසාන පරීක්ෂණයට ඉදිරිපත් නොවී ඉන්දියාවට යෑමට තීරණය කොට තිබුණා. නමුත් ඉන්දියානු ගමන වැළකුණු නිසා අවසාන පරීක්ෂණයට ඉදිරිපත් වූවා. එම පරීක්ෂණයෙන් සමත් වී 1970 දී යුද හමුදවට බැඳුණා. එම අවස්ථාවේදී ඉන්දියාවට ගියා නම් දෛවය වෙනස් වීමට ඉඩ තිබුණා. ශිෂ්‍ය භට ජීවිතය තුළදීත් හමුද ජීවිතය තුළදීත් එබඳු දෛවෝපගත සිදුවීම් සිදුවී තිබෙනවා.

මෙම කටයුත්ත මම තනියෙන් කරන දෙයක් නොවෙයි. විශේෂයෙන්ම ආනන්දයේ ආදි ශිෂ්‍යයකු වන ආරක්ෂක ලේකම්වරයා ලෙස කටයුතු කරන ගෝඨාභය රාජපක්ෂ මහතාට හමුදව පිළිබඳව විශේෂ දැනුමක් තිබෙන බව සඳහන් කළ යුතුයි. ඔහුත් මමත් යාපනය කොටුව බේරා ගැනීමේ මෙහෙයුම වැනි මෙහෙයුම් වලට සම්බන්ධ වී තිබෙනවා. යාපනය කොටුව බේරා ගැනීමේ මෙහෙයුමේ අණ දෙන නිලධාරීන් දෙදෙනා ලෙස ඔහුත් මමත් කටයුතු කළා. එම කටයුතු නිසා දැනුම හැකියාව පිළිබඳව අප අතර අවබෝධයක් තිබෙනවා. මා පිළිබඳව විශ්වාසය තබා අවශ්‍ය පරිදි තීරණ ගැනීමට මෙහෙයුම් යොමු කිරීමට නිදහස ලබාදී තිබෙනවා. අප අතර පවත්නා විශ්වාසය ඊට හේතුවී තිබෙනවා.

ආරක්ෂක ලේකම්වරයා අවංකව කෙලින් කටයුතු කරන නිලධාරියකු බව අප දන්නවා. ගෝඨාභය රාජපක්ෂ මහතා හමුදවේ කටයුතු කළ කාලයෙදීත් සොරකම් කළේ නැහැ. ඒ වගේම වැරදි වැඩ කළෙත් නැහැ. එම නිසා ඔහු පිළිබඳව විශ්වාසයක් තිබෙනවා. මමත් වංචාකරන, සොරකම් කරන අය යටතේ වැඩ කිරීමට කැමැති නැහැ. එබඳු ප්‍රශ්න නොමැති නිසා අපි සහයෝගයෙන් කටයුතු කරනවා.



ආනන්දයේ විදුහල්පතිව සිටි එල්. එච්. මෙත්තානන්දයන්ගේ ලිපි සමුච්චියක් සහිත පොතක් බලමින්...

ගෝඨාභය රාජපක්ෂ මහතා ආරක්ෂක ලේකම්වරයා ලෙස කටයුතු කරන නිසා ජනාධිපතිතුමා සමග තිබෙන සම්බන්ධයත් ශක්තිමත් වී තිබෙනවා. අපගේ අදහස් සහ ක්‍රියාවන් ජනාධිපතිතුමාට පැහැදිලි කිරීමේ හැකියාව ආරක්ෂක ලේකම්වරයාට තිබීමත් එම තත්ත්වය ඇතිවීමට හේතුවී තිබෙනවා. ගෝඨාභය රාජපක්ෂ මහතා වගේම ත්‍රිවිධ හමුදව තුළ කටයුතු කරන තවත් ආනන්දයේ ආදි ශිෂ්‍යයන් සිටිනවා. නාවික හමුදාපති වයිස් අද්මිරාල් වසන්ත කරන්නාගොඩ මහතාත් ආනන්දයේ ආදි ශිෂ්‍යයෙක්. ඒ වගේම යුද හමුදවේ මාණ්ඩලික ප්‍රධානියාත් ආනන්දයේ ආදි ශිෂ්‍යයෙක් වනවා. ඒ වගේ තවත් විශාල පිරිසක් සිටිනවා.

ජනාධිපතිවරයාගේ සහෝදරයකු වන බැසිල් රාජපක්ෂ මහතාත් මමත් ආනන්දයේ එකම පංතියේ අධ්‍යාපනය ලබා තිබෙනවා. එම සම්බන්ධයත් අප අතර විශ්වාසය වැඩිවීමට හේතු වී තිබෙනවා. එපමණක් නොවෙයි අග්‍රාමාත්‍ය රත්නසිරි වික්‍රමනායක මහතා, ජ්‍යෙෂ්ඨ ඇමැතිවරයකු වන කරු ජයසූරිය මහතාත් ආනන්දයේ ආදි ශිෂ්‍යයන් වනවා. ඔවුන්ගේ සහයෝගයත් අපට ලැබෙනවා.

සමහර පුද්ගලයන් ප්‍රකාශ කරන්නේ වත්මන් යුදමය තත්ත්වයට 1956 දී බලයට පත්වූ මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුව ගත් සමහර තීරණ හේතු වී ඇති බවයි.

එය කෙසේ වුවත් තවත් පුද්ගලයන් ප්‍රකාශ කරන්නේ 1956 දී සිදුවූ දේශපාලන පෙරළියේ පුරෝගාමී නායකයකු වන එල්. එච්. මෙත්තානන්ද මහතා අනාගතයේදී ශක්තිමත් හමුදාවක අවශ්‍යතාව දැක කොළඹ ආනන්ද විද්‍යාලයේ ශිෂ්‍ය භට කණ්ඩායම ශක්තිමත් කිරීමට කටයුතු කළ බවයි. ආනන්ද විද්‍යාලයේ ශිෂ්‍යයන් එවකට පැවැති ආණ්ඩු විසින් හමුදවට බඳවා නොගත් අවස්ථාවලදී මෙත්තානන්ද මහතා ඒ පිළිබඳව ඉහළ නිලධාරීන්ට සහ දේශපාලකයන්ට පවා පැමිණිලි කිරීමටද කටයුතු කොට ඇත. කොළඹ ආනන්ද විද්‍යාලයේ ශිෂ්‍ය භට කණ්ඩායම නගා සිටුවීම සඳහා පුරෝගාමී කාර්ය භාරයක් ඉටු කොට කළේ එම විද්‍යාලයේ හිටපු විදුහල්පති එල්. එච්. මෙත්තානන්ද මහතායි.

එරික් ගාමිණී පිනප්‍රිය